69969

OFFICE COPY

# ජලභීතිකා රෝගය පිළිබඳ ආඥා පනත

Office of the Registrar of Books & Newspapers,
18 JUL 57
CEYLON

පහත සඳහන් සංශෝධනයන් මෙහි ඇතුළත්ව ඇත

1941ක් අංක 13 දරණ ආඥා පනත

1957

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

කොළඹ ආණ්ඩුවේ ග්‍රන්ථ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල ශත 20යි. තැපැල් ගාස්තුව: ශත 10යි.

# ජලභීතිකා රෝගය පිළිබඳ ආඥා පනත

**මෙම දිවයිනේ ජලභීතිකා රෝගය මර්දනය කිරීම සඳහා විධිවිධාන යෙදීම පිණිස පනවන ලද ආඥා පනතකි.**

[1894 ජේ ජනවාරි 2 වැනිදා]

1. මෙම ආඥා පනත ජලභීතිකා රෝගය පිළිබඳ ආඥා පනත නමින් හැඳින් විය හැකි ය. — ලුහුඬු නාමය.

2. මෙම ආඥා පනතෙහි, ඉදින් ප්‍රස්තුතයෙහි හෝ පද සංසන්දන යෙහි වෙනත් අර්ථයක් අනවශ්‍ය කල්හි — — පදාර්ථ.

"රෝගය" යනුවෙන්, "ජලභීතිකා රෝගය"ත්;

"රෝගී" යනුවෙන්, "ජලභීතිකා රෝගය හටගත්" යනුත් අදහස් වන්නේ ය.

"පොලිස් නිලධාරියා" යන්නෙහි, පොලිස් පරීක්ෂකවරු සරයන්වරුන් හා කොස්තාපල්වරුද සියලුම ගම්මුලාදෑනීන් හා සාම නිලධාරීහු ද ඇතුළත් වන්නා හ.

"දඩාවතේ යන බල්ලා" යනුවෙන්, දඩාවතේ ඇවිදින්නාවූ ද, කිසිවෙකුගේ පාලනය හෝ භාරය නැත්තා වූ ද, බල්ලෙක් අදහස් වන්නේ ය.

"සැක කරන ලද" යනුවෙන්, ජලභීතිකා රෝගය හටගත් හැටියට සැක කරන ලද යනු අදහස් වන අතර, "සැක කරන ලද සතෙකු" යන්නට, කිසියම් රෝගී හෝ සැක කරන ලද බල්ලෙකු විසින් සපා කන ලද නැතහොත් රෝගී හෝ සැක කරන ලද සතෙකු හා සපශිවූ නැතහොත් වෙනත් අයුරකින් ජලභීතිකා රෝගය බෝවූ සතෙක් ද ඇතුළත් වන්නේ ය.

3. මෙම ආඥා පනතෙහි, ඉදින් ප්‍රස්තුතයෙහි හෝ පද සංසන්දන යෙහි වෙනත් අර්ථයක් අනවශ්‍ය කල්හි, "ප්‍රාදේශික බලධරයා" යනුවෙන් පහත දක්වෙන විස්තර අතුරෙන් යම්කිසි විස්තරයකට වැටෙන තැනැත්තෙක් අදහස් වන්නේ ය. එකී විස්තර නම් — — ප්‍රාදේශික බලධරයා යන්න විස්තර කිරීම.

(අ) මහා නගර සභා සීමාවක් ඇතුළත නම්, එහි නගරාධිපති;

(ආ) නගර සභා සීමාවක් ඇතුළත නම්, එහි සභාපති;

(ඇ) සුළු නගර සභා සීමාවක් ඇතුළත නම්, එහි සභාපති;

(ඈ) මහා නගර සභා, නගර සභා හෝ සුළු නගර සභා සීමාවලින් පිට, පළාත් හෝ දිස්ත්‍රික්ක සීමාවක් ඇතුළත නම්, පිළිවෙළින් ආණ්ඩුවේ දිසාපති හෝ සහකාර දිසාපති තැන, හා,

(ඉ) සෑම පොලිස් නිලධාරියෙක් ද මෙම ආඥා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්‍ය සඳහා මහා නගර සභාවක නගරාධිපති තැන හෝ නගර සභාවක හෝ සුළු නගර සභාවක සභාපති තැන හෝ ආණ්ඩුවේ දිසාපති හෝ සහකාර දිසාපති කෙනෙකු හෝ විසින් ලිපියකින් නියියාකාරයෙන් බලය දෙන ලද සෑම තැනැත්තෙක් ද වෙති.

4. සර්වකීය බල ප්‍රදේශය ඇතුළත සිටින සියලු ම දඩාවතේ යන බල්ලන් අල්ලා ලීමට සෑම ප්‍රාදේශික බලධරයෙකු විසින් ම විධිවිධාන සැලැස්විය යුතු අතර, එම බල්ලන් සම්බන්ධයෙන් පහත සඳහන් අයුරින් ක්‍රියා කළ යුතු ද වන්නේ ය:— — දඩාවතේ යන සියලුම බල්ලන් ඇල්ලිය යුතු බව.

ක්‍රියා කළයුතු අයුරු.

(අ) බල්ලා රෝගය හටගත් හෝ සැකයට භාජන වූ සතෙකු නොවේ නම්, ඌ කිසියම් නිසි තැනක නවත්වා, ප්‍රාදේශික බලධරයාට සුදුසු යයි හැඟී යන කාල සීමාවක් එතැනම එසේ රඳවා තබා ගත යුතු ය. එසේ වුව ද, බල්ලාගේ අයිතිකරු හෝ ඌ භාරව සිටි වෙනත් තැනැත්තා කවරෙකු ද යන බව දන්නේ නම්, බල්ලා අල්ලා ගත් බව හා රඳවා තබා සිටින බව ඔවුනතුරෙන් කෙනෙකුට ප්‍රාදේශික බලධරයා විසින් වහාම දන්විය යුතු ය. එසේ ම, එබඳු අල්ලා ගැනීම හා රඳවා තබා ගැනීම සඳහා වියදම් වූ සාධාරණ මුදලක් ගෙවූ විට, මෙම ආඥාපනතේ කිසියම් විධිවිධානයක් කඩ කිරීම සම්බන්ධයෙන් අය කර ගත හැකි කිසියම් දඩ මුදලක් අය කර ගැනීමට බාධාවක් නො වන පරිද්දෙන් පූර්වෝක්ත දන්වීම කරනු ලැබූ තැනැත්තාට හෝ ඔහුගේ නියෝජිතයාට බල්ලා භාර දිය යුතු ය ;

ඉල්ලා නොසිටින බල්ලෝ.

(ආ) එසේ අල්ලා ගනු ලැබ රඳවා ගෙන සිටින බල්ලා, ඉහත කී පරිදි දන්වීමක් කොට, දින දෙකක් ඇතුළත දී ඉල්ලා සිටිනු නො ලැබුවහොත් හෝ බල්ලා අයිතිකරු හෝ ඌ භාරව සිටින වෙනත් තැනැත්තා නොදන්නා කල්හි, එසේ අල්ලා ගනු ලැබ දින තුනක් ඇතුළත හෝ ඉදින් එසේ අල්ලා රඳවා තබා ගැනීමට ගිය වියදම වශයෙන් සාධාරණ මුදලක් නො ගෙවුව හොත්, බල්ලා විනාශ කර දමන්නට හෝ සුදුසු යයි තමාට වැටහෙන වෙනත් ක්‍රමයකින් බල්ලාගෙන් නිදහස් වන්නට ප්‍රාදේශික බලධරයාට පිළිවන.

ස්වකීය දැනුවත්කම ඇතිව බල්ලෙකුට ස්වකීය නිවස උගේ සාමාන්‍ය ගැවසෙන ස්ථානය කර ගැනීමට ඉඩ දෙන තැනැත්තා එබඳු බල්ලාගේ අයිතිකරු හැටියට සැලකෙන බව.

5. ස්වකීය දැනුවත්කම ඇතිව බල්ලෙකුට තමාගේ නිවස උගේ සාමාන්‍ය ගැවසෙන ස්ථානය කර ගැනීමට ඉඩ දෙන සෑම තැනැත්තෙක් ම, මෙම ආඥා පනතේ කාර්‍ය සම්බන්ධයෙන් එබඳු බල්ලාගේ අයිතිකරු හැටියට සලකනු ලබන හා පිළිගනු ලබන අතර, එබඳු බල්ලා විසින් කරනු ලබන දේපළ හානි වන හා කරදරකාරී සියලුම ක්‍රියාවලට සිවිල් නීති අනුව හෝ අපරාධ නීති අනුව වග කිය යුතු වන්නේ ය.

යම් තැනැත්තෙකුට කිසියම් බල්ලෙකු මැරිය හැකි අවස්ථාව කුමක් ද යන බව.

6. තමා සපා කන කිසියම් බල්ලෙකු එතැන ම මරා දැමීමත්, රෝගී යයි විශ්වාස කිරීමට සෑහෙන හේතු ඇති, එසේම ආරක්ෂා සහිත ලෙස බැඳ නැති හෝ වෙනත් අයුරකින් රඳවා තබා නැති කවර බල්ලෙකු වුව ද, ලුහුබැඳ මරා දැමීමත් කවර තැනැත්තෙකුට වුව ද නීත්‍යනුකූලව කළ හැක්කේ ය.

රෝගී වූ බල්ලෙකුගේ හෝ වෙනත් සතකුගේ ස්වාමිත්වය හෝ අයිතිය ඇති තැනැත්තා ඒ ගැන පොලිස් නිලධාරියාට දැනුම් දීම.

7. (1) රෝගී හෝ රෝගී යයි සැක කරනු ලැබූ නැතහොත්, රෝගී යයි සැක කරන්නට සෑහෙන හේතු ඇති බල්ලෙකු හෝ වෙනත් සතෙකු විසින් සපා කනු ලැබූ බල්ලෙකුගේ හෝ වෙනත් සතෙකුගේ අයිතිකරුවකු වූ සෑම කෙනෙක් ම, නැතහොත් එබඳු බල්ලෙකු හෝ වෙනත් සතෙකු භාරව සිටින සෑම කෙනෙක් ම, එම බල්ලා හෝ වෙනත් සතා ප්‍රවේසම් සහිතව බැඳ තබන්නට හෝ වෙනත් අයුරකින් රඳවා තබන්නට සලස්සා, එම බල්ලා හෝ සතා එසේ රෝගී වීමේ, සැක කරනු ලැබීමේ හෝ සපා කනු ලැබීමේ සත්‍යය, එසේ රෝගී වූ, සැක කරනු ලැබූ, හෝ සපා කෑ බල්ලා හෝ සතා සිටි හෝ සිටින දිස්ත්‍රික්කයේ පොලිස් නිලධාරියෙකුට වහාම දැනුම් දිය යුතු වන්නේ ය.

(2) එබඳු දැනුම් දීමක් ලබන පොලිස් නිලධාරි තැන, මෙම ආඥා පනතේ 3 වැනි වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) යන ඡේදවල විස්තර කර ඇති ප්‍රාදේශික බලධරයන් වෙත එම ආරංචිය වහාම යැවිය යුතු අතර, එම බලධරයන් විසින් ඒ බව සෞඛ්‍ය අධ්‍යක්ෂ තැනට හා ආණ්ඩුවේ පශු වෛද්‍ය නිලධාරි තැනට එසේ ම දන්වා යැවිය යුතු වන්නේ ය.

(1) වැනි උප වගන්තිය යටතේ දැනුම් දීමක් ලැබීමේ දී ක්‍රියා කළයුතු ආකාරය.

(3) පහත සඳහන් පරිදි ක්‍රියා කිරීම එබඳු සෑම පොලිස් නිලධාරි යෙකුගේ ම යුතුකම වන්නේ ය:—

පොලිස් නිලධාරි තැනගේ යුතුකම.

(අ) රෝගී වූ හෝ කිසියම් පරීක්ෂාවකින් පසු, රෝගී වූ බව දැන ගන්නට ලැබුණු සෑම බල්ලෙකු හෝ වෙනත් සතෙකු මරා දැමීම;

(ආ) එබඳු කිසියම් සැක කරනු ලැබූ හෝ සපා කෑ බල්ලෙකු හෝ වෙනත් සතෙකු වෙත විටින් විට ගොස් පරීක්ෂා කර බැලීම; හා

(ඇ) එබඳු සෑම ගමනකින් හා පරීක්ෂණයකින් පසු එබඳු බල්ලා ගේ හෝ සතාගේ තත්වය 3 වැනි වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) යන ඡේදවල විස්තර කර ඇති යම් ප්‍රාදේශික බලධරයෙකුගේ බල සීමාවට පූර්වෝක්ත බල්ලා හෝ සතා සිටින ස්ථානය ඇතුළත් වන්නේ ද, එම ප්‍රාදේශික බලධරයාට දැනුම්දීම ද වන්නේ ය. තවද එබඳු ගමන් හා පරීක්ෂණ පැවැත් විය යුතු කාලය එම ප්‍රාදේශික බලධාරීන් විසින් තීරණය කළ යුතු ය.

8. ජලභීතිකා රෝගය ඇතැයි විශ්වාස කටයුතු ආරංචියක් ලබන්නා වූ නැතහොත් ජලභීතිකා රෝගය ඇතැයි සැක කරන්නට සෑහෙන හේතු ඇත්තා වූ පොලිස් නිලධාරි තැන එබඳු ජලභීතිකා රෝගය ඇතැයි වාර්තා වූ ස්ථානයට වහාම ගොස්, මෙම ආඥා පනත මගින් හෝ ඒ යටතේ සම්පාදිත නියෝග මගින් ඔහු වෙත පැවරී ඇති බලතල ක්‍රියාවේ යෙදිය යුතු වන්නේ ය.

ජලභීතිකා රෝග ඇති ස්ථානයට පොලිස් නිලධාරියා යා යුතු බව.

9. සවකීය බලසීමාව ඇතුළත ජලභීතිකා රෝගය ඇති වූ විට අණ බෙර ලැවීමෙන් හෝ තමාට සුදුසු යයි හැඟෙන වෙනත් ක්‍රමයකින් ඒ බව මහජනයාට දැනුම්දීම මෙම ආඥා පනතේ 3 වැනි වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) යන ඡේදවල විස්තර කර ඇති ප්‍රාදේශික බලධරයන්ට නීත්‍යනුකූලව කළ හැකි වන්නේ ය. එසේ ම, පහත දැක්වෙන කාර්ය සඳහා හෝ එයින් යම් කිසිවක් සඳහා කලින් කල හෝ කවර වේලාවක හෝ අමාත්‍යවරයාගේ අනුමත කරනු ලැබීමට යටත්ව නියෝග සම්පාදනය කිරීමත්, සම්පාදිත නියෝග අවලංගු කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා වෙනස් කිරීම හා සංශෝධනය කිරීමත් එබඳු කවර ප්‍රාදේශික බලධරයෙකුට වුව ද නීත්‍යනුකූලව කළ හැකි වන්නේ ය. එකී කරුණු නම්—

නියෝග.

(අ) කිසියම් ප්‍රසිද්ධ මාර්ගයක හෝ ස්ථානයක නැතහොත් එබන්දක් ඇතුළෙහි සිටින අවස්ථාවල දී, ප්‍රාදේශික බලධරයාට සුදුසු යයි කල්පනා වන අන්දමේ නිදහස් කිරීම් ඇතොත් එම ස්ථාන හැර, බල්ලන්ට මුව වැසුම් දැමීමට විධිවිධාන යෙදීම;

(ආ) නියෝගවලින් නියම වී ඇති ආකාරයෙන් බල්ලාගේ අයිති කරු විසින් හෝ ඌ භාරව සිටින තැනැත්තා විසින් බල්ලන් සවකීය පාලනය යටතේ තබා ගැනීමට විධි විධාන යෙදීම;

(ඇ) එබඳු නියෝගවලින් නියම වී ඇති ආකාරයෙන් සවකීය පාලනය යටතේ තබා නො සිටින බල්ලන් ඇල්ලීම, රඳවා තැබීම හා විනාශ කිරීම ද ඇතුළු වෙනත් ක්‍රමයකින් නිදහස් වීමට විධිවිධාන යෙදීම;

(ඈ) එබඳු කිසියම් නියෝගයක් යටතේ අල්ලා රඳවා තබා නිදහස් වූ කිසියම් බල්ලෙකු නවත්වා තැබීම සම්බන්ධයෙන් දරන්නට යෙදුන වියදම් එම බල්ලාගේ අයිතිකරු ගෙන් ප්‍රාදේශික බලධරයාට අය කර ගැනීමට විධිවිධාන යෙදීම;

(ඉ) බල්ලන්ගේ ප්‍රදර්ශන පැවැත්වීමත්, බල්ලන් ප්‍රදර්ශනවලට තැබීම හෝ ප්‍රදර්ශනවල දී විකිණීමත් තහනම් කිරීම හෝ විධිමත් කිරීම;

(ඊ) බල්ලන්ට හෝ සැක කරන ලද සතුන්ට බෙහෙත් විදීම හෝ ඔවුන් පරීක්ෂා කිරීම පිණිස එබඳු කිසියම් ප්‍රාදේශික බලමණ්ඩලයක් ඇතුළත බෙහෙත් විදින මධ්‍යස්ථාන පිහිටුවීම හා එබඳු මධ්‍යස්ථාන විධිමත් කිරීම, පරිපාලනය හා පාලනය කිරීම;

(උ) ජලභීතිකා රෝගය ඇද්දැයි දැන ගැනීම සඳහා බල්ලන් හෝ සැක කරන ලද සතුන් බලයෙන් ම පරීක්ෂා කිරීම, බල්ලන් හෝ සැක කරන ලද සතුන්ට ජලභීතිකා රෝගය වැළඳීම වැළැක්වීම පිණිස බලයෙන් ම බෙහෙත් විදීම, හා එබඳු පරීක්ෂා කිරීම හෝ බෙහෙත් විදීම සම්බන්ධයෙන් ගාස්තු නියම කිරීම හා පැනවීම ද වේ.

නියෝග ප්‍රසිද්ධ කිරීම.

10. යම්කිසි නියෝගයක් ප්‍රාදේශික බලධරයා විසින් සම්පාදිතව එකතු කරන ලදුව, වෙනස් කරන ලදුව හෝ සංශෝධිතව මෙම ආඥාපනත යටතේ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ විට, ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබේ. එසේ ප්‍රසිද්ධ කළ පසු, ඉහත කියන ලද ආකාරයෙන් අවලංගු කරනු ලබන තෙක් එම නියෝගවල නීතියෙහි බලය ඇත්තේ ය.

ප්‍රාදේශික බලධරයාගේ ප්‍රකාශනයෙන් පසු බල්ලන් විනාශ කිරීම.

11. (1) මෙම ආඥාපනතේ කවර විධිවිධානයක කුමක් තිබුණත්, 3 වැනි වගන්තියේ (අ), (ආ), (ඇ) සහ (ඈ) යන ඡේදවල අර්ථානුගතව ප්‍රාදේශික බලමණ්ඩලයක්, සවකීය බල සීමාව ඇතුළත ජලභීතිකා රෝගය ඇතැයි හෝ ජලභීතිකා රෝග භයක් ඇතැයි හෝ සැහීමකට පත්වුවහොත්, බල සීමාව ඇතුළත ප්‍රමුඛ ස්ථානවල ලිඛිත දැන්වීමක් තැන්පත් කිරීමෙන් ද අණබෙර ලැවීමෙන් හා සුදුසු යයි වැටහෙන වෙනත් මාර්ගවලින් ද පූර්වෝක්ත සීමාව ඇතුළත පිහිටි ප්‍රදේශය හෝ ගම් හෝ වතු එකක් හෝ වැඩි ගණනක් පමණක් ඇතුළත් වූ එහි කිසියම් කොටසක්, ජලභීතිකා රෝගය ඇති ප්‍රදේශයක් හෝ එම රෝග භය ඇති ප්‍රදේශයක් හැටියට ප්‍රකාශනයට පත් කරන්නට පිළිවන.

(2) එසේ ප්‍රකාශයට පත් කරන ලද කිසියම් ප්‍රදේශයක හෝ එහි කොටසක් ඇතුළත පිහිටි කිසියම් ප්‍රසිද්ධ ස්ථානයක හෝ මාර්ගයක, නැතහොත් පුද්ගලික ගොඩනැගිල්ලක්, මිදුලක් හෝ ගෙවත්තක් නො වන කිසියම් තැනක සිට හමුවන නො බඳින ලද හෝ දක්කා ගෙන නො යනු ලබන කවර බල්ලෙක් වුව ද, ඒ කාර්යය සඳහා ප්‍රාදේශික බලධරයා විසින් සාමාන්‍ය වශයෙන් හෝ විශේෂ වශයෙන් ලිපියකින් බලය දෙනු ලැබූ කවර තැනැත්තෙකු විසින් හෝ විනාශ කර දමනු ලැබීමට යටත් වන අතර, මහා නගර සභාවක,

නගර සභාවක, හෝ සුළු නගර සභාවක සීමාවෙන් පිටත වූ කිසියම් ප්‍රදේශයක සිදු කෙරෙන එබඳු කිසියම් විනාශ කිරීමක වියදම මහා ආණ්ඩුවේ අරමුදලෙන් ගෙවනු ලැබේ.

(3) (1) වැනි උප වගන්තියෙන් විධිවිධාන යෙදී ඇති ආකාරයෙන් ප්‍රකාශනය කළ කල්හි එබඳු කවර ප්‍රකාශනයක් වුව ද වලංගු වන අතර ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ඊට පසු කලාපයක එය ප්‍රසිද්ධ කළ යුතු වන්නේ ය.

රෝගී බල්ලන්, සැක කරන ලද බල්ලන් හා බල්ලන් ගෙන් පිටස්තර වූ රෝගී සතුන් විනාශ කිරීම. ප්‍රාදේශික බලධර යාට අයිතිකරුගේ දැනුම් දීම.

12. සෑම පොලිස් නිලධාරියෙක් හා 3 වැනි වගන්තියේ (ඉ) ඡේදය යටතේ නිසියාකාර බලය දෙන ලද සෑම තැනැත්තෙක් ම තමාගේ දිස්ත්‍රික්කය ඇතුලේ සිටින රෝගී වූ සෑම බල්ලෙකු ද සුදුසු යයි හැඟේ නම්, තම දිස්ත්‍රික්කය ඇතුලේ සිටින සැක කරනු ලැබූ කිසියම් බල්ලෙකු හෝ බල්ලෙකුගෙන් පිටස්තර වූ රෝගී වෙනත් කිසියම් සතෙකු හෝ විනාශ කර දමන්නට සැලැස්සිය යුතු ය. එසේ වුව ද, එබඳු බල්ලෙකු හෝ සතෙකු විනාශ කර දමනු ලැබීමට තමා විරුද්ධ බව අයිතිකරු විසින් එම ප්‍රාදේශික බලධරයාට ලිපියකින් දැනුම් දුන්නහොත්, ප්‍රාදේශික බලධරයාට සෞඛ්‍ය අධ්‍යක්‍ෂතැනගේ දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරියෙකු ලවා එම සතා පරීක්‍ෂා කරන්නට සැලැස්සිය යුතු ය. ඉක්බිති, එබඳු බල්ලා හෝ සතා විනාශ කර දැමිය යුතු යයි එබඳු නිලධාරියා නිගමනය කළහොත් ප්‍රාදේශික බලධරයා එම සතා විනාශ කර දමන්නට සැලැස්සිය යුතු වන්නේ ය.

වැරදි වලට දඬුවම්

13. මෙම ආඥා පනත යටතේ වැරදි හැටියට මෙයින් ප්‍රකාශ කරනු ලබන පහත සඳහන් ක්‍රියා හා පැහැර හැරීම් සම්බන්ධයෙන් පහත සඳහන් දණ්ඩන නියම කර ඇත්තේ ය:—

නියෝග කඩ කිරීම.

(1) මෙම ආඥා පනතට විරුඬව හෝ මෙම ආඥා පනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රාදේශික බලධරයකු විසින් සම්පාදිත කිසියම් නියෝගයකට විරුද්ධව යමක්සිවක් කළහොත් හෝ පැහැර හැරියොත්, තමාගේ ක්‍රියා හා පැහැර හැරීම් සම්බන්ධයෙන් හා ඒවා අනුව බල්ලාගේ අයිතිකරු ද තත්කාලයේ බල්ලා භාරව සිටි තැනැත්තා ද වරදකරුවන් වීමේ දී රුපියල් සියයකට නො වැඩි දඩයකට යටත් වන්නෝ ය.

7 වැනි වගන්තිය යටතේ දැනුම් නොදීම පිළිබඳ දඬුවම්.

(2) රෝගී වූ හෝ සැක කරනු ලැබූ බල්ලෙකු හෝ වෙනත් සතෙකු, නැතහොත් රෝගී යයි සාධාරණ ලෙස සැක කළ හැකි බල්ලෙකු හෝ වෙනත් සතෙකු විසින් සපා කන ලද බල්ලෙකු හෝ වෙනත් සතෙකුගේ අයිතිකරු හෝ එබඳු සතෙකු දැන දැන ම ස්වකීය ස්වාමිත්වය යටතේ තබා සිටින තැනැත්තෙක් මෙම වගන්තියේ 7 වැනි වගන්තියෙන් නියම වී ඇති පරිදි පොලිස් නිලධාරියෙකුට දැනුම් දෙන්නට අපොහොසත් වුවහොත්, වරදකට වරදකාරයා වීමේ දී රුපියල් සියයකට නො වැඩි දඩයකට හෝ මාස තුනකට නො වැඩි කාලයක් වැඩ රහිත හෝ බරපතල වැඩ සහිත බන්ධනාගාර දඬුවමකට හෝ දඩය ය, සිර දඬුවම ය යන දණ්ඩන දෙකට ම හෝ යටත් වන්නේ ය.

7 වැනි වගන්තිය යටතේ පැවරී ඇති යුතුකම් පොලිස් නිලධාරියා විසින් පැහැර හරිනු ලැබීම.

(3) රෝගී බල්ලෙකු පිළිබඳව දැන්වීමක් ලබන සෑම පොලිස් නිලධාරියෙක් ම, මෙම ආඥා පනතේ 7 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති කිසියම් යුතුකමක් ඉටු කරන්නට අපොහොසත් වුවහොත්, වරදකරු වීමේ දී රුපියල් සියයකට නො වැඩි දඩයකට හෝ මාස තුනකට නො වැඩි කාලයක වැඩ රහිත හෝ බරපතල වැඩ සහිත බන්ධනාගාර දඬුවමකට හෝ දඩය ය, සිර දඬුවම ය යන දණ්ඩන දෙකට ම හෝ යටත් වන්නේ ය.

රෝගී බල්ලන්ට දඩාවතේ යන්නට ඉඩ දීම.

(4) රෝගී හෝ සැක කරන ලද, නැතහොත් රෝගී යයි සාධාරණ ලෙස සැක කරන ලද කිසියම් බල්ලෙකු හෝ වෙනත් සතෙකු විසින් සපා කන ලද බල්ලෙකුගේ හෝ වෙනත් සතෙකුගේ අයිතිකරු එම සතා රෝගී බව සැක කරනු ලබන බව හෝ රෝගී යයි සැක කරන ලද බල්ලෙකු හෝ වෙනත් සතෙකු විසින් සපා කන ලද බව ආරංචි වූ පසු නැතහොත් දැන ගත් පසු, එම බල්ලාට හෝ වෙනත් සතාට දඩාවතේ යන්නට ඉඩ හැරියොත්, වරදකරු වීමේ දී හෙතෙම රුපියල් සියයකට නො වැඩි දඩයකට හෝ තුන් මාසයකට නො වැඩි වැඩ රහිත හෝ බරපතල වැඩ සහිත බන්ධනාගාර දඬුවමකට හෝ දඩය ය, බන්ධනාගාර දඬුවම ය යන දණ්ඩන දෙකට ම හෝ යටත් වන්නේ ය.

සතුන් සහ රබීස් මෙරටට ගෙන්වීම

14. ජලභීතිකා රෝගය ඇත්තේ යයි විශ්වාස කරන්නට හේතු ඇති කිසියම් ස්ථානයකින් ලංකාවට බල්ලන් ගෙන්වීම තමාට සුදුසු යයි හැඟෙන පරිදි ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන ආඥාව කින් කලින් කල තහනම් කිරීම හෝ ප්‍රධාන රේගු අයකැමි විසින් බලපත්‍රයේ ඇතුළත් කළයුතු හැටියට කලින් කල නියම කරන කොන්දේසි ඇතුළත් කොට ස්වකීය අත්සන තබා ලිපියකින් දෙනු ලබන බලපත්‍රයක් නොමැතිව කිසිම බල්ලෙකු මෙරටට නො ගෙන් විය යුතු යයි නියෝග කිරීම හෝ අමාත්‍යවරයාට නීත්‍යනුකූලව කළ හැක්කේ ය.

(2) පූර්වෝක්ත බලපත්‍රයට එය නිකුත් කරනු ලබන නැනැත්තා විසින් සැපයිය යුතු රුපියල් පහේ මුද්දරයක් ඇලවිය යුතු ය.

එසේ වුව ද, ගැසට් පත්‍රයේ නිවේදනයක් පළ කිරීමෙන් ඇමති වරයාට විස්තර කළ හැකි අත්දමේ බල්ලන් හෝ බලු වර්ගී සම්බන්ධ යෙන් නිකුත් කරනු ලබන සියලුම බලපත්‍ර මෙම උප වගන්තියේ නියම වලින් නිදහස් වන්නේ ය.

(3) එබඳු තහනමකට හෝ එබඳු ආඥාවක ඇතුළත් නියෝගයකට විරුද්ධව කිසියම් බල්ලෙකු දැන දැන ම මෙරටට ගෙන්වන හෝ ගෙන්වන්නට තැත් කරන්නා වූ නැතහොත් එබඳු කිසියම් බලපත්‍ර යක ඇතුළත් කිසියම් කොන්දේසියක් කඩ කරන්නා වූ කවර නැනැත්තෙක් වුව ද, වරදකට වරදකාරයා වීමේ දී රුපියල් සියයකට නො වැඩි දඩයකට හෝ මාස තුනකට නො වැඩි කාලයක වැඩ රහිත බන්ධනාගාර දඬුවමකට හෝ යටත් වන්නේ ය.

(4) ආඥාවේ විස්තර කර ඇති ව්‍යතිරේක හා සංශෝධනවලට යටත්ව, අමාත්‍යවරයාගේ විනිශ්චයේ හැටියට ජලභීතිකා රෝගය බෝවිය හැකි සෙසු වෙනත් සතුන් සම්බන්ධයෙන් ද, ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන ආඥාවක මාර්ගයෙන් මෙම වගන් තියේ විධිවිධාන අදාළ කර වත්නට අමාත්‍යවරයාට පිළිවන.

අධිකරණ බලය මහේස්ත්‍රාත් උසාවියට ගිය බව.

15. අපරාධ නඩු විධාන සංග්‍රහයේ මීට විරුද්ධව කුමක් තිබුණ ද මෙම ආඥා පනත යටතේ වූ සෑම නඩු පැවරීමක් ම එම වරද සිදුවූ නැතහොත් වරදකරු හමු වූ කොට්ඨාසයට අයත් මහේස්ත්‍රාත් උසාවියේ පැවරිය හැකි ය.

ආරංචි දන්නාගේ කොටස.

16. මෙම ආඥා පනත යටතේ දඩයක් නියම කිරීමේ දී සත්‍ය වශයෙන් ම අය කර ලබා ගන්නා වූ දඩ මුදලෙන් දෙකෙන් කොටස කට වැඩි නොවූ කිසියම් කොටසක් ආරංචිය දුන් නැනැත්තාට ප්‍රදානය කිරීම, උසාවියට නීත්‍යනුකූලව කළ හැක්කේ ය.